මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| බුද්ධ ධර්මය I/II | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..............................................................................................

## I පත්‍රය

**සැ.යු.**

- **ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මුළු ලකුණු 40 කි.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) පස්මහ බැලුම් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. ඇස, කන, නාසය, දිව, ශරීරය iii. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ

ii. කාලය, දීපය, දේශය, කුලය, මව iv. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ

2) **"රජතුමනි මේ කුමරු ඒකාන්තයෙන් ම බුදු වෙනවා, එබැවින් මම සිනාසුණෙමි. කුමරු බුදුවන්නට පෙර මා මිය යන බැවින් හැඬුවෙමි"** මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?

i. සුදොවුන් රජු විසිනි. iii. අසිත තාපසතුමා විසිනි.

ii. කිසා ගෝතමිය විසිනි. iv. පස්වග තවුසන් විසිනි.

3) සිදුහත් කුමරු අභිනිෂ්ක්‍රමණය කළේ කුමන පොහොය දිනක ද?

i. වෙසක් පොහොය දිනක ය. iii. පොසොන් පොහොය දිනක ය.

ii. ඇසළ පොහොය දිනක ය. iv. උඳුවප් පොහොය දිනක ය.

4) බුද්ධරත්නය වන්දනා කරන ගාථාව වන්නේ,

i. ඉතිපිසෝ භගවා අරහං...යන ගාථාවයි.

ii. සුපටිපන්නෝ භගවතෝ...යන ගාථාවයි.

iii. ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ... යන ගාථාවයි.

iv. වන්දාමි චේතියං සබ්බං... යන ගාථාවයි.

5) පුද්ගලයෙකුගේ මනස සංවර කර ගැනීමට මෙත් වැඩීම මහත්සේ ඉවහල් වේ. මෙත් වැඩීමෙන් ලැබෙන අනුසස් ප්‍රමාණය කොපමණ ද?

i. අනුසස් 9කි. ii. අනුසස් 10කි. iii. අනුසස් 11කි. iv. අනුසස් 14කි.

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර තෝරා ලියන්න.**

6) රාහුල කුමරුගේ මව...................................................................වේ.

7) දියුණුවේ දොරටු.......................................... තම පියා විසින් පුතාට පෙන්වා දෙන ලදී.

8 ) සීල, සමාධි, ප්‍රඥා...................................................නමින් හැඳින් වේ.

9) තමා වරදින් වැළකීම, අන් අය ලවා වැරදි නොකරවීම, අන් අය කරන වැරදි අනුමත නොකිරීම යන අංග....................................................සීලයට අයත් වේ.

10) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනුවෙන් හඳුන්වන්නේ....................................වේ.

**(ත්‍රි ශික්ෂාව, ත්‍රිකෝටික පාරිශුද්ධ, සිව්බඹ විහරණ, යශෝධරා දේවිය, හයක්)**

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල *"අ" කොටසට* අදාළ නිවැරදි පිළිතුර *"ආ" කොටසෙන්* තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

| *"අ" කොටස* | | *"ආ" කොටස* |
|---|---|---|
| **11)** වැව් පොකුණු සෑදීම් ආදී පොදු කටයුතු කළේ, | (.........) | 1 බුදුරජාණන් වහන්සේ. |
| 12) ශ්‍රී ලාංකීය ජාතියේ සංකේතය | (.........) | 2 මඝ කුමරු ඇතුළු පිරිස |
| 13) ආනන්ද සර්පයා දුටුවා ද යනුවෙන් අසන ලද්දේ, | (.........) | 3 අනිත්‍යතාවය යි. |
| 14) ලොව පණ ඇතිදේ හා පණනැති දේ නිතර වෙනස්වන ලක්ෂණය, | (.........) | 4 රාහුල කුමරුට ය. |
| 15) කැඩපත උපමාවට පෙන්වා දුන්නේ, | (.........) | 5 ජාතික කොඩිය යි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල අදාළ ප්‍රකාශය හරි නම් හරි ( √ ) ලකුණ ද, වැරදි නම් වැරදි (×) ලකුණ ද වරහන තුළ සටහන් කරන්න.**

16) ආර්යාෂ්ටාංගික මාර්ගය දුක්ඛ නිරෝධගාමිණී පටිපදාර්යය සත්‍යයට අයත් වේ. (   )

17) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි යනුවෙන් සඳහන් වන්නේ **"මම පණ ඇති සතුන් මැරීමේ සිල්පදය සමාදන්වෙමි"** යන අර්ථයයි. (   )

18) ආහාර පාන සපයාදීම, අවශතා ඉටුකරදීම දරුවන් විසින් ඉටුකරන යුතුකම්වලට අයත් ය. (   )

19) මඝ ඇතුළු පිරිස ඇතා විසින් මරණයට පත් නොකළේ ඔවුන් ළඟ මන්ත්‍රයක් තිබූ නිසාවෙනි. (   )

20) ජාතික ගීයේ නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතා ය. (   )

## බුද්ධ ධර්මය - II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. අනෙක් ප්‍රශ්නවල එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60කි.**

**1) ඔබ පෙර උගත් ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i. ඔබ උගත් ඇගයීමක නම සඳහන් කරන්න.

ii. එම ඇගයීම කරගෙන යාම සඳහා ඔබ උදව් ලබාගත් 2 කුගේ නම් ලියන්න.

iii. ඇගයීම් ක්‍රියාකාරකම කිරීම සඳහා ඔබ භාවිතා කළ උපකරණ 2ක් සඳහන් කරන්න.

iv. ඇගයීම් ක්‍රියාකාරකම සම්පූර්ණ කර ගැනීම සඳහා ඔබ තොරතුරු ලබාගත් පොත්පත් 2ක් සඳහන් කරන්න.

v. ඔබ සැකසූ ඇගයීම පංතියට ඉදිරිපත් කළ ආකාරය ගැන වාක්‍ය 2 ක් ලියන්න.

vi. **"මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි"** යන පන්සිල් පදයේ අරුත ලියන්න.

vii. පන්සලට ඔබ පිවිසිය යුතු ආකාරය ගැන කරුණු 4ක් සඳහන් කරන්න.

viii. පන්සිල් සුරකින සමාජය හොඳ සමාජයකි. මේ ගැන වාක්‍යය 4 ක් සඳහන් කරන්න. **(ප්‍රශ්න අංක i - vi දක්වා ලකුණු 2 බැගිනි. අංක vii - viii දක්වා ලකුණු 4 බැගිනි. )**

2) i. සිදුහත් බෝසත් කුමරු උපත ලැබුවේ කුමන සල් උයනේ ද? **(ලකුණු 2)**

ii. **"අග්ගෝ හමස්මි ලෝකස්ස..."** මෙම ගාථාව සම්පූර්ණ කරන්න. **(ලකුණු 3)**

iii. එම ගාථාවෙහි අර්ථය ලියන්න. එම ගාථාව සිදුහත් කුමරුගේ මුවින් පිටවූයේ කුමන අවස්ථාවේ ද? **(ලකුණු 5)**

3) i. නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

ii. සතර පෙර නිමිති නම් කරන්න.

iii. සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග 2ක් සඳහන් කර, ඉන් ජයගත් ආකාරය ගැන කෙටියෙන් ලියන්න.

4) i. භාවනාව වඩන විට ශිෂ්‍යයින් හා ශිෂ්‍යයාවන් හිඳගත යුතු ආකාර 2ක නම් කරන්න.

ii. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ලැබෙන අනුසස් 3ක් සඳහන් කරන්න.

iii. ඔබ මෛත්‍රී භාවනාව වැඩීම සිදුකරන ආකාරය කෙසේදැයි වාක්‍යය 5කින් සඳහන් කරන්න.

5) i. විරමණය හා සමාදානය යන වදන් දෙකෙහි අර්ථය සඳහන් කරන්න.

ii. සම්මා වාචාවට අයත් (යහපත් වචන) කරුණු 3ක් සඳහන් කරන්න.

iii. යහපත් වචන කථා කිරීම තුළින් සමාජයක් යහ මගට හරවා ගත හැකි ය.

**"අපි යහපත් වචන කථා කරමු"** යන මාතෘකාව යටතේ පංතියේ ප්‍රදර්ශනය කළ හැකි වාක්‍යය 5ක් නිර්මාණය කරන්න.

6) i. බුදුරජාණන් වහන්සේ සිගාලක ගෘහ පුත්‍රයාට දේශනා කළ සූත්‍රය කුමක් ද?

ii. දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කරන යුතුකම්වලින් 3ක් සඳහන් කරන්න.

iii. ඔබ විසින් දෙමාපියන්ට ඉටු කරන හෝ ඉටු කිරීමට බලාපොරොත්තු වන යුතුකම් 5ක් ලියා දක්වන්න.

7) i. ලංකාවේ ජාතික පුෂ්පය හා වෘක්ෂය නම් කරන්න.

ii. ජාතික කොඩියෙහි අඩංගු සංකේත 3ක් නම් කරන්න.

iii. ජාතික කොඩිය භාවිතා කරන විට අප විසින් සැළකිලිමත් විය යුතු අංග 5ක් සඳහන් කරන්න.